# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2451/11 - 2025 අගෝස්තු මස 26 වැනි අඟහරුවාදා - 2025.08.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

එල්.ඩී.-බී.5/2025

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 18 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඊ) ඡේදය සමග කියවිය යුතු, ඒ පනතේ 50 වන වගන්තිය යටතේ බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**පුණ්‍ය ශ්‍රී කුමාර ජයකොඩි,**
බලශක්ති අමාත්‍ය.

2025 අගෝස්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2025 ශ්‍රී ලංකා විදුලිබල (ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග, අනුප්‍රාප්තික සමාගමකට අනියුක්ත වීම ස්වකීය තේරීම නොවන්නා වූ ද 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 18 වන වගන්තියේ (3) වන උපවගන්තියේ ( ඊ) ඡේදයේ විධිවිධානවල සඳහන් (මෙහි මින්මතු "ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය" ලෙස සඳහන් කරනු ලබන) ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයක් යටතේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාම සඳහා හිමිකම් ලබන්නා වූ ද, ලංකා විදුලිබල මණ්ඩලයේ (මෙහි මින්මතු "සේවානියුක්තයා" ලෙස සඳහන් කරනු ලබන) සෑම නිලධරයකුට සහ සේවකයකුට අදාළ විය යුතු ය.

3. 2 වන නියෝගය යටතේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාම සඳහා හිමිකම් ලබන යම් සේවානියුක්තයකු විසින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය.


1A - PG 7235 — 324 (2024/08)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4\. (1) ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර කාර්ය මණ්ඩලය යටතේ සේවය කරනු ලබන පහත සඳහන් වර්ගීකරණයන්ට අයත් සේවානියුක්තයන්ට ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය යටතේ ගෙවනු ලැබිය යුතු වන්දි මුදල පහත සඳහන් පරිදි විය යුතු ය:-

(අ) වසර දහයක් හෝ වසර දහයකට වඩා වැඩි සේවා කාලයක් ඇති සේවානියුක්තයන් සඳහා -

(i) පසුගිය සේවා කාලයේ සෑම මාස දොළහක් සඳහා ම මාස 2.0 ක වැටුප; සහ

(ii) සේවය කළ හැකිව තිබූ ඉතිරි කාලයේ සෑම මාස දොළහක් සඳහා ම මාස 1.5 ක වැටුප:

(ආ) වසර දහයකට අඩු සේවා කාලයක් ඇති සේවානියුක්තයන් සඳහා -

(i) පසුගිය සේවා කාලයේ සෑම මාස දොළහක් සඳහා ම මාස 5.0 ක වැටුප; සහ

(ii) සේවය කළ හැකිව තිබූ ඉතිරි කාලය සඳහා ගෙවීමක් සිදු කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වන්දි මුදල රුපියල් ලක්ෂ නවයක අවම සීමාවකට සහ රුපියල් මිලියන පහක උපරිම සීමාවකට යටත්ව ගෙවනු ලැබිය යුතු ය.

5\. කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ සේවය කරනු ලබන සේවානියුක්තයන් හැර, ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර කාර්ය මණ්ඩලය යටතේ සේවය කරනු ලබන සේවානියුක්තයන් වශයෙන් වර්ගී කරණය කර නොමැති සේවානියුක්තයන් සඳහා ගෙවනු ලැබිය යුතු වන්දි මුදල පහත සඳහන් පරිදි විය යුතුය :-

(අ) පසුගිය සේවා කාලයේ සෑම මාස දොළහක් සඳහාම මාස 2.0 ක වැටුප;

(ආ) අවම වන්දි මුදල මාස දොළහක වැටුප විය යුතුය; සහ

(ඇ) වන්දි මුදල ගණනය කිරීමේ ක්‍රමය - (22 x දෛනික වේතනය x මාස ගණන)

6\. 4 වන නියෝගය හෝ 5 වන නියෝගය යටතේ ගෙවනු ලැබිය යුතු වන්දි මුදල, අතුරු දීමනා සහ අනෙකුත් දීමනා හැර විශ්‍රාම යන අවස්ථාවේ දී අර්ථසාධක අරමුදලේ මුදල් ප්‍රමාණය ගණනය කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන ඔහුගේ මාසික වැටුප පදනම් කර ගනිමින් ගණනය කරනු ලැබිය යුතු ය.

7\. වන්දි මුදලට අමතරව, සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් අදාළ පනත්වල විධිවිධාන ප්‍රකාරව සිදු කරනු ලැබිය යුතුය.

8\. විනය පරීක්ෂණවලට භාජනය වී සිටින හෝ කිසියම් විනිශ්චය සභාවක් ඉදිරියේ ප්‍රශ්නගත සේවා තත්ත්වයක් මත සිටින සේවානියුක්තයන් මේ නියෝග යටතේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලැබිය යුතු ය.

9\. අදාළ සේවානියුක්තයන්ගෙන් අයවිය යුතුව පවතින සියලු ම හිඟ මුදල්, 4 වන නියෝගය හෝ 5 වන නියෝගය යටතේ ගෙවනු ලැබිය යුතු වන්දි මුදලින් අයකර ගනු ලැබිය යුතු ය.

10\. ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය යටතේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යනු ලබන සහ මේ නියෝග යටතේ නිශ්චිතව දක්වා ඇති වන්දි මුදල ගෙවනු ලැබූ යම් සේවානියුක්තයකු කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ යම් අනුප්‍රාප්තික සමාගමක සේවයෙහි යොදවනු නොලැබිය යුතු ය.

(3 වන නියෝගය)

**උපලේඛනය**

**ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමය සඳහා අයදුම් පත්‍රය**

සේවානියුක්තයා විසින් සම්පූර්ණ කළ යුතුය :-

1. සේවානියුක්තයාගේ නම :-

2. ජාතික හැඳුනුම්පත් අංකය:-

3. අර්ථසාධක අරමුදල් අංකය :-

4. තනතුර:-

5. උපන් දිනය :-

6. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයට බැඳුණු දිනය (යම් කාල සීමාවක් තාවකාලිකව සේවය කර ඇත්නම් එම කාලසීමාව හැර) -

7. ලංකා විදුලිබල මණ්ඩලයේ සම්පූර්ණ කළ සේවා කාලයේ වසර ගණන :-

8. විකල්ප විශ්‍රාම යාම සඳහා යොමුවන්නා වූ දිනය :-

9. මා විසින් -

(අ) ඉහත සඳහන් කර ඇති තොරතුරු සම්පූර්ණ හා සත්‍ය බවත්;

(ආ) මා විසින් ගෙවිය යුතු කවර ආකාරයේ වුව ද සියලුම ණය මුදල් / හිඟ මුදල් ආදිය, අයකර ගනු ලැබීමට සහ නිරවුල් කර ගැනීමට ........................................ (අස්ථිත්වයේ නම) වෙත මෙයින් බලය පවරනු ලබන බවත්;

(ඇ) ඉහත සඳහන් ප්‍රකාශයන්ගෙන් කිසිවක් යම් හෙයකින් අසත්‍ය බව අනාවරණය වුවහොත්, මෙම යෝජනා ක්‍රමය යටතේ .................................... (අස්ථිත්වයේ නම) විසින් මා වෙත කරන ලද ගෙවීම, ............................................ (අස්ථිත්වයේ නම) විසින් මා හට එරෙහිව ගනු ලබන යම් ක්‍රියාමාර්ගයකට අගතියකින් තොරව මාගෙන් අයකර ගත හැකි බවට මා විසින් එකඟ වන බවත්;

(ඈ) 2025 ශ්‍රී ලංකා විදුලිබල (ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි) නියෝගවල නියම කර ඇති නියම සහ කොන්දේසි අනුව .............................. (අස්ථිත්වයේ නම) හි සේවයෙන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාම සඳහා මා එකඟ වන බවත්,

මෙයින් සහතික කරමි.

දිනය: ................................,
අයදුම්කරුගේ අත්සන.

EOG 08 - 0285

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.